REFERENCE ONLY

B

2016.07.20

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2016
## බුද්ධ ධර්මය I , II

කාලය පැය 03 යි.

විභාග අංකය: .......................................................

| 10 ශ්‍රේණිය | I කොටස |
|---|---|

**උපදෙස්**

- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
  දී ඇති පිළිතුරුවලින් වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා ගන්න.

01. අප විසින් කළ යුතු දේ කිරීම ශීලයේ දී හඳුන්වනු ලබන්නේ,
    (1) විරිත් ලෙසිනි. (2) විරමණය ලෙසිනි.
    (3) සිරිත් ලෙසිනි. (4) චාරිත්‍ර ලෙසිනි.

02. සීලය තුළින් ඇති වන සංවරය වනුයේ,
    (1) මානසික - කායික සංවරයයි. (2) කායික - වාචසික සංවරයයි.
    (3) වාචසික - මානසික සංවරයයි. (4) කායික - මානසික සංවරයයි.

03. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි භෝග විනාශ මුඛ ගණන කීයද?
    (1) 5 කි. (2) 3 කි.
    (3) 6 කි. (4) 7 කි.

04. පිසුනා වාචා ලෙස දස අකුසල්වල දක්වෙන්නේ,
    (1) බොරුබස් කීමයි. (2) හිස් වචන කීමයි.
    (3) පරුෂ වචන කීමයි. (4) කේලම් කීමයි.

05. අටලෝ දහමට අයත් නොවන දහම් කරුණ වනුයේ,
    (1) ලෝභ ය. (2) අලාභ ය.
    (3) යසස ය. (4) දුක ය.

06. පංච ශීලය ආරක්ෂා කරන්නා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
    (1) සන්නිවේදන අයිතිය සුරකින්නෙකි. (2) දේපල අයිතිය සුරකින්නෙකි.
    (3) ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කරන්නෙකි. (4) ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන්නෙකි.

07. බුදුන් වහන්සේ සදිසාව සම්බන්ධ ගිහි විනය ඇතුළත් සූත්‍ර දේශනාව කරන ලද්දේ,
    (1) සිඟාලක ගෘහපති පුත්‍රයාට (2) සුභ මානවකයාට
    (3) තෝදෙය්‍ය බමුණාට (4) චුන්ද සූකරික තරුණයාට

08. බුද්ධා දී අට තැන්හි සැකය අයත්වන නීවරණය වනුයේ,
    (1) ව්‍යාපාදය (2) ථීනමිද්ධය
    (3) විචිකිච්ඡාව (4) කාමච්ඡන්දය

09. සිඟාලෝවාද සූත්‍රය අනුව උතුරු දිසාව දක්වන්නේ,
    (1) මවුපියන් ය. (2) ගුරුවරුන් ය.
    (3) සේවකයන් ය. (4) හිත මිතුරන් ය.

10. සමථ භාවනාවේ ප්‍රතිඵලයක් නොවනුයේ,
(1) පංච අභිඥාව ලැබීම ය. (2) පංච නීවරණ යටපත් වීම ය.
(3) අෂ්ට සමාපත්ති ලැබීම ය. (4) නිර්වානය ලැබීමට හැකි වීම ය.

11. සතර මහා භූත රූප අතුරෙන් උෟෂ්ණ සීතල ආදී ස්වභාවය හඳුන්වනුයේ,
(1) පඨවි ධාතුව ලෙස ය. (2) අපෝ ධාතුව ලෙස ය.
(3) තේජෝ ධාතුව ලෙස ය. (4) වායෝ ධාතුව ලෙස ය.

12. කනට ශබ්දයක් ගැටීම නිසා,
(1) චක්ඛු විඥ්ඥාණය උපදී. (2) සෝත විඥ්ඥාණය උපදී.
(3) ඝාණ විඥ්ඥාණය උපදී. (4) කාය විඥ්ඥාණය උපදී.

13. මමය මාගේය යයි කිසිවක් ගත නොහැකි බව දක්වන ත්‍රි ලක්ෂණ අංගය වනුයේ,
(1) අනිත්‍ය (2) දුක්ඛ
(3) නිත්‍ය (4) අනාත්ම

14. දුටුගැමුණු රජු සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
(1) විහාර මහා දේවියගේ පුතණුවන් ය. (2) වෙසක් උත්සව 24 ක් පවත්වා ඇත.
(3) ලෝවාමහාපාය ඉදි කරන ලදී. (4) තමා කළ පින්, පොතක සටහන් කරන ලදී.

15. "සතිමතො" යන්නෙහි අදහස වන්නේ,
(1) පිරිසිදුව කටයුතු කිරීම. (2) එළඹ සිටි සිහිය.
(3) නොපසුබස්නා උත්සාහය. (4) සිතා, විමසා බලා කටයුතු කිරීම.

16. බුදු දහම වූ කලී අපට යටිගම් බලා යාම හැරපියා උඩුගම් බලා යාමට පොළඹ වනුයේ,
(1) අනුසෝතගාමී ය. (2) පටිසෝතගාමී ය.
(3) මධ්‍යස්ථය. (4) මේ කිසිවක් නොවේ.

17. ධම්ම පදය බෞද්ධයන්ගේ හස්ථ සාර ග්‍රන්ථයේ ඇති ගාථා ගණන හා වග්ග ගණන පිළිවෙළින්,
(1) 426 හා 23 කි. (2) 423 හා 23 කි.
(3) 427 හා 26 කි. (4) 423 හා 26 කි.

18. සිගාලෝවාද සූත්‍රය අනුව සැමියා විසින් බිරිඳට ඉටු කළ යුතු යුතුකම් අතරට අයත් නොවනුයේ,
(1) ගෙදර කටයුතු මැනවින් කිරීම. (2) ගරු කිරීම.
(3) අවමන් නොකිරීම. (4) ගෙදර වගකීම් පැවරීම.

19. "සමවායෝ එවසාධු" යනු,
(1) සමගිය යහපති යන්නයි. (2) සමගිවන්න යන්නයි.
(3) විවාද නොකරන්න යන්නයි. (4) සමගි වී සාදු කියන්න යන්නයි.

20. අත්තූපනායික ධර්ම පර්යාය යන්නෙහි අදහස වනුයේ,
(1) තමා උපමා කර කුසල් වඩන්න යන්න ය.
(2) තමා උපමා කර ධර්ම දේශනා කරන්න යන්න ය.
(3) තමා උපමා කර අනුන් ගැන හිතන්න යන්න ය.
(4) සත්ව හිංසනයෙන් වැළකිය යුතු යන්න ය.

21. "සුසුඛංවත ජීවාම - වේරිනේසු අවේරිනෝ" යන ධම්ම පද ගාථාව අයත් වග්ගය වනුයේ,
(1) සුඛ වග්ගය. (2) සහස්ස වග්ගය.
(3) යමක වග්ගය. (4) පණ්ඩිත වග්ගය.

22. බෞද්ධ හේතුඵල දහම හඳුන්වන තවත් නමක් වනුයේ,
(1) පුනර්භවය. (2) පටිච්ච සමුප්පාදය.
(3) අෂ්ඨ ලෝක ධර්මය. (4) චතුරාර්ය සත්‍යය.

23. සම්මා ආජීව ලෙස අරි අටගි මගෙහි දක්වනුයේ,
(1) යහපත් දිවි පැවැත්මයි. (2) යහපත් ක්‍රියාවයි.
(3) යහපත් කර්මාන්තයයි. (4) යහපත් කල්පනාවයි.

24. යම් ක්‍රියාවක විපාක ශක්තිය ඇතිවීමට නම් ක්‍රියාව,
(1) සචේතනික විය යුතුය. (2) අචේතනික විය යුතුය.
(3) කුසල-අකුසල විය යුතුය. (4) අකුසල කර්ම විය යුතුය.

25. වචනයෙන් සිදුවන අකුසලයක් නොවන්නේ,
(1) බොරු කීමයි. (2) සත්‍ය කීමයි.
(3) හිස් වචන කීමයි. (4) පරුෂ වචන කීමයි.

26. කුසල මූලයන් අතර නිර්ලෝභී බව හා නොමසුරු බව දක්වන්නේ,
(1) අමෝහයෙන් ය. (2) අලෝභයෙන් ය.
(3) අද්වේෂයෙන් ය. (4) ලෝභයෙන් ය.

27. වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි කර්මය නොවනුයේ,
(1) කටත්තා කර්ම (2) ආචිණ්ණ කර්ම
(3) ආසන්න කර්ම (4) ගරුක කර්ම

28. උසස් රූප ශෝභාවකට හිමිකම් කීම අයත් සම්පත්තිය වනුයේ,
(1) ගති සම්පත්තිය (2) උපධි සම්පත්තිය
(3) කාල සම්පත්තිය (4) ප්‍රයෝග සම්පත්තිය

29. ත්‍රි ලක්ෂණ අවබෝධයට යෙදිය හැකි වඩාත් සුදුසු ම වචනය වනුයේ,
(1) ශ්‍රද්ධාවයි. (2) ප්‍රඥාවයි.
(3) අනිත්‍යයි. (4) සමථයයි.

30. පංචස්කන්ධයේ අසාර බව පෙන්වන උපමාවලින් මිරිඟුවකට උපමා කරන ලද්දේ,
(1) රූපය (2) වේදනාව
(3) සඤ්ඤාව (4) සංස්කාර

31. අනිත්‍ය හා දුක්ඛ යන වචන දෙක සඳහා විරුද්ධාර්ථ පද පිළිවෙළට දක්වන පිළිතුර වනුයේ,
(1) සදාකාලික - සතුට (2) නිත්‍ය - සුඛ
(3) තාවකාලික - දොම්නස (4) සත්‍ය - සැප

32. "අනිච්චාවත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ" යන ගාථාව අයත් සූත්‍රය වනුයේ,
(1) ගිරිමානන්ද සූත්‍රය (2) පරිනිබ්බාන සූත්‍රය
(3) චූල්ල කම්ම විභංග සූත්‍රය (4) අනිත්‍ය ප්‍රතිසංයුක්ත සූත්‍රය

33. රජගහ නුවරදී උපතිස්ස පරිබ්‍රාජකයාට "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව දේශනා කළේ,
(1) බුදු හිමියන් විසින් ය. (2) සැරියුත් තෙරුන් විසින් ය.
(3) අස්සජි රහතන් වහන්සේ විසින් ය. (4) ආනන්ද හිමි විසින් ය.

34. "ඉමස්මිං සති ඉදං හෝති" යනු,
(1) මෙය ඇති කල්හි මෙය පවතී. (2) මෙය ඉපදීමෙන් මෙය උපදී.
(3) මෙය නැති කල්හි මෙය නොවේ. (4) මෙය නැතිවී යාමෙන් මෙය නැති වේ.

35. බුදු දහමේ එන සිවුසස් දහම ඇතුළත් මූලික ම සූත්‍ර දේශනාව වනුයේ,
(1) අනත්ත ලක්ඛණ සූත්‍රයයි. (2) දම්සක් පැවතුම් සූත්‍රයයි.
(3) චූල්ල හත්ථි පදෝපම සූත්‍රය යි. (4) සච්ච විභංග සූත්‍රයයි.

36. පස්කම් සැපතට ඇති දැඩි ආශාව හඳුන්වන්නේ,
(1) කාම තණ්හාව ලෙසයි. (2) භව තණ්හාව ලෙසයි.
(3) විභව තණ්හාව ලෙසයි. (4) රූප තණ්හාව ලෙසයි.

37. ශීල ශික්ෂාවට අයත් නොවන ආර්ය මාර්ගයක් නොවනුයේ,
(1) සම්මා දිට්ඨි (2) සම්මා වාචා
(3) සම්මා කම්මන්ත (4) සම්මා ආජීව

38. බුදුරජාණන් වහන්සේ දෙවන හා තෙවන වස් කාලයන් ගත කළේ,
(1) වෙළුවනාරාමයේ ය. (2) ජේතවනාරාමයේ ය.
(3) ඉසිපතනාරාමයේ ය. (4) මකුල පර්වතයේ ය.

39. බුදුරජාණන් වහන්සේ ඇට්ටේරියා වනයක දී දේශනා කළ සූත්‍රයක් වනුයේ,
(1) කසී භාරද්වාජ සූත්‍රය (2) සිංසපා සූත්‍රය
(3) මහා සීහනාද සූත්‍රය (4) ධනිය ගෝපාල සූත්‍රය

40. බුදුන් වහන්සේ ලෝක සත්ත්වයා වෙනුවෙන් පරාර්ථ චර්යාවෙහි යෙදුන වසර ගණන වනුයේ,
(1) අවුරුදු 80 කි. (2) අවුරුදු 06 කි.
(3) අවුරුදු 45 කි. (4) අවුරුදු 35 කි.

REFERENCE ONLY

B

2016.07.20

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

## බුද්ධ ධර්මය I , II

විභාග අංකය: ......................................................

| 10 ශ්‍රේණිය | II කොටස |
|---|---|

**උපදෙස්**

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. i. භද්ද කච්චායනා දේවියගේ පියා වූයේ කවුද?

ii. මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. යන අදහස ඇති නිබ්බුත පද කීවේ කවුද?

iii. විහාරස්ථානයක ඇති ත්‍රිවිධ චෛත්‍යයට අයත් අංග 02ක් නම් කරන්න.

iv. මනාව පිළිවෙත් සුරකින නිසා සංඝ රත්නය කෙබඳු ගුණයෙන් යුක්ත ද?

v. උඩගු නොව මහණ ලෙස දොරටුවේ ලියා තැබූ ලාංකීය බුද්ධ පුත්‍රයාණන් කවුද?

vi. දුටුගැමුණු රජතුමා ඉදිකළ දාගැබ් වහන්සේලා 02ක් නම් කරන්න.

vii. පංචස්කන්ධයේ අංග අතුරෙන් 02ක් නම් කරන්න.

viii. සතර මහා භූත රූප නම් කරන්න.

ix. සිව් බඹ විහරණවල ඇති අන් අයගේ සැපත දැක සතුටුවීමේ ගුණය හඳුන්වන නාමය කුමක් ද?

x. විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද අතුරෙන් 02ක් නම් කරන්න.

02. i. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් සදිසාවට අනුව නැගෙනහිර දිසාවෙන් හා බටහිර දිසාවෙන් පෙන්වා දෙන සමාජ සංස්ථා පිළිවෙළින් නම් කරන්න.

ii. සදිසා සංකල්පයට අනුව දරුවන්ගෙන් දෙමාපියන්ට සිදුවන යුතුකම් 03ක් ලියා දක්වන්න.

iii. සිඟාලෝවාද සූත්‍රය පෙන්වාදෙන ආකාරයට ශිෂ්‍යයන් විසින් තම ගුරුවරුන්ට සැලකිය යුතු ආකාරය ඒ හා සම්බන්ධ යුතුකම් ඔස්සේ ගෙන හැර දක්වන්න.

03. i. "පටිසෝතගාමී" වචනයේ අර්ථය කෙටියෙන් ලියන්න.

ii. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ඔබට ද පද්මාකාර ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර ගත යුත්තේ කෙසේ දැයි පහදන්න.

04. i. නිබ්බේධික සූත්‍රයේ කර්මය පෙන්වා දෙන ආකාරය ලියන්න.

ii. විපාක දෙන කාලය අනුව කර්මය සතරාකාර වේ. 03ක් නම් කරන්න.

iii. අකුසල ක්‍රියා තුළින් අකුසල විපාකත් කුසල ක්‍රියා නිසා කුසල විපාකත් ලැබේ. ධර්මානුකූලව මේ බව පහදන්න.

05. i. "අනිච්චාවත සංඛාරා" යන පාඨයේ කෙටි අරුත ලියන්න.

ii. බුදු දහමේ එන ත්‍රි ලක්ෂණය නම් කර එක් එක් කරුණ කෙටියෙන් විස්තර කරන්න.

iii. ත්‍රිලක්ෂණය පිළිබඳ කරුණු හරිහැටි වටහාගෙන ජීවත් වීමේ දී ඔබ්ට ලැබෙන ප්‍රයෝජන පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න.

06. i. "සමග්ගාහෝථ මා විවදථ" යන්නෙහි සරල තේරුම ලියා දක්වන්න.

ii. ජාතික හා ආගමික සහජීවනයට බුදුරජාණන් වහන්සේ කළ ඉගැන්වීම් 03ක් ලියන්න.

iii. බුදු දහමෙහි එන ආගමික සහජීවනය පාසල් දරුවන් වශයෙන් අප ඇති කර ගත යුතු අන්දම පැහැදිලි කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතුරෙන් 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. දුක්ඛාර්ය සත්‍යය

ii. කාම තණ්හා

iii. සම්මා වායාම

iv. ත්‍රි ශික්ෂාව